*සැ. යු.* - 2022.07.08 වැනි දින පළ වූ අංක 2288 දරන ගැසට් පත්‍රයේ III කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,289 - 2022 ජූලි මස 15 වැනි සිකුරාදා - 2022.07.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1180 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1185 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1187 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1190 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1192 |

*සැ. යු.* - විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත 2022 ජූනි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 අගෝස්තු මස 05 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 ජූලි මස 22 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කැස්බෑව

### අධිකරණයට ඉදිරිපත් කරන ලද භාණ්ඩ වෙන්දේසි කිරීම

කැස්බෑව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරන ලද මෙහි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩයන් **2022.08.06 වැනි සෙනසුරාදා දින පෙ. ව. 10.00 ට** අධිකරණ භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා ගෙන වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩයන් එදින පෙ. ව. 9.00 සිට පෙ. ව. 10.00 දක්වා පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමට අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගන්නා භාණ්ඩයන් සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර එවෙලේ ම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළයුතු අතර චෙක්පත් මුදල් ඇනවුම් ආදිය කිසිසේත් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිල දී ගන්නන් විසින් තමන්ගේ අනන්‍යතාවය ජාතික හැඳුනුම්පත හෝ ඒ හා සමාන පිළිගත හැකි ලියවිල්ලකින් තහවුරු කළ යුතු ය.

වයි. ආර්. බී. නෙලුන්දෙනිය,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
කැස්බෑව.

2022 ජූලි මස 05 වැනි දින,
කැස්බෑව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | PR අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|---|
| 01. | AR/2784/21 | 751/20 | පරිගණකයේ මොනිටර් යන්ත්‍ර 01 |
| 02. | | 446/20 | ටෙලිසොනික් කැසට් යන්ත්‍ර 01 |
| 03. | AR/28/22 | 2950/21 | බැටරි 02 |
| 04. | 96142 | 1830/18 | ප්ලාස්ටික් පුටු 06 |
| 05. | 96142 | 1830/18 | ප්ලාස්ටික් පුටු 06 |
| 06. | 96142 | 1830/18 | ප්ලාස්ටික් පුටු 06 |
| 07. | 96142 | 1830/18 | ප්ලාස්ටික් පුටු 06 |
| 08. | | | බැරල් 15 |
| 09. | | | බූලි 04 |
| 10. | අංක රහිත | | උදැල්ලක් |
| 11. | අංක රහිත | | උදලු තල 05 |
| 12. | අංක රහිත | | හිස් බෝතල් තොගය |
| 13. | 4441 | 955/20 | 1/2 කහපාට ගෑස් සිලින්ඩර් |
| 14. | 7886 | 1439/21 | කහපාට 5 kg සිලින්ඩර් |
| 15. | 1892/16(76573) | 2970/16 | නිල් පැහැති 2.5 kg සිලින්ඩර් 02 |
| 16. | 7927 | 1457/21 | කහපාට 12.5 kg ගෑස් සිලින්ඩරය |
| 17. | 86759(920/18) | 939/18 | 5 kg ගෑස් සිලින්ඩරය |
| 18. | 77449 | 4220/16 | 12.5 kg ගෑස් සිලින්ඩර් 02 |
| 19. | 91838 | 630/19 | 5 kg නිල් පැහැති |
| 20. | 1269/16(76532) | 2558/16 | ගෑස් සිලින්ඩර් 01 |
| 21. | 7996 | 1476/21 | 12.5 kg ගෑස් සිලින්ඩරය |
| 22. | 8238 | 1567/21 | ගෑස් සිලින්ඩරය |
| 23. | 2147(994/20) | | 2.5 kg කුඩා ගෑස් සිලින්ඩරය |
| 24. | 8237 | 1565/21 | නිල්පාට ගෑස් සිලින්ඩරය |
| 25. | 8158 | 94/21 | ගෑස් සිලින්ඩර් 01 |
| 26. | 79352 | 407/17 | රෙගියුලේටරය, ගෑස් ලිප් 01 |
| 27. | 91858 (464/19) | 605/19 | රෙගියුලේටරය, ගෑස් ලිප |
| 28. | 95670 | 723/19 | රෙගියුලේටරය, ගෑස් ලිප |
| 29. | 91838 | 630/19 | ගෑස් ලිප |
| 30. | 51391 | - | ගෑස් ලිප |
| 31. | 86686 | 1695/18 | ගෑස් ලිප් 02 |
| 32. | 8158 | 94/21 | රෙගියුලේටරය, ගෑස් ලිප් 01 |
| 33. | 91854(463/19) | | ගෑස් ලිප් 01 |
| 34. | 96752 | | රෙගියුලේටරය ගෑස් ලිප් 02 |
| 35. | 8369 | | රෙගියුලේටරය සහිත ගෑස් ලිප |
| 36. | | | 731202 යතුරු ලියනය (අබලන්) |
| 37. | | | 6975072 යතුරු ලියනය (අබලන්) |
| 38. | | | 7328056 යතුරු ලියනය (අබලන්) |
| 39. | | | 7328094 යතුරු ලියනය (අබලන්) |
| 40. | | | 7328139 යතුරු ලියනය (අබලන්) |
| 41. | BR/2089/13 | | පාපැදිය |
| 42. | BR/992/14 (62579) | | පාපැදිය |
| 43. | AR/535/18 | | පාපැදිය |
| 44. | AR/91/20 | | පාපැදිය |
| 45. | BR/1439/16 (94856) | | පාපැදිය |
| 46. | 76224 | | අංක රහිත යතුරු පැදිය (කැබලිකර විකිණීමට) |
| 47. | 9198 | | WP MC 8327 යතුරු පැදිය |
| 48. | BR/510/13 | | SP VA 5933 යතුරු පැදිය |
| 49. | 2481 | | WP XT 6871 යතුරුපැදිය |
| 50. | 61994 | | SGTM 5142 (කැබලි කර විකිණීමට) |
| 51. | 89003 | | 131 - 6383 (කැබලි කර විකිණීමට) |

| අනු. අංකය | නඩු අංකය | *PR* අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|---|
| 52. | 99466 | | WP BHL 0597 (කැබලි කර විකිණීමට) |
| 53. | 61233 | | UB 1781 යතුරු පැදිය (කැබලි කර විකිණීමට) |
| 54. | 67009 | | 159 - 7838 (කැබලි කර විකිණීමට) |
| 55. | 85271 | | UU 9994 (කැබලි කර විකිණීමට) |
| 56. | 3113 | | අංක රහිත යතුරු පැදිය (කැබලි කර විකිණීමට) |
| 57. | 26946 | | WP JY 4936 (කැබලි කර විකිණීමට) |
| 58. | AR/130/21 | | WPMJ 9791 යතුරු පැදිය |
| 59. | BR/551/11 | | SP UJ 3453 යතුරු පැදිය (කැබලි කර විකිණීමට) |
| 60. | 84229 | | SP BCM 7574 යතුරු පැදිය |
| 61. | 69968 | | WP BAJ 1900 යතුරුපැදිය |
| 62. | AR/131/21 | | WP BEB 0020 යතුරු පැදිය |
| 63. | AR/134/21 | | WP BND 1874 යතුරු පැදිය (කැබලි කර විකිණීමට) |
| 64. | 69123 | | 143 - 3487 යතුරුපැදිය |
| 65. | 92704 | | 1578165 යතුරු පැදිය (කැබලිකර විකිණීමට) |
| 66. | 82067 | | AAQ 6240 ත්‍රීරෝද රථය |
| 67. | BR/267/06 | 33/6 | රන් යයි කියනු ලබන කරාබු ජෝඩු 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 68. | BR/513/06 | 56/6 | රන්යයි කියනු ලබන වළලු 02ක් අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 69. | BR/54/06 | 162/6 | රන්යයි කියනු ලබන මුදු 01, පෙන්ඩන්ඩ් 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 70. | BR/1305/06 | 23/7 | රන්යයි කියනු ලබන කැබලි 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 71. | BR/985/07 | 37/8 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 72. | BR/1269/07 | - | රන්යයි කියනු ලබන පෙන්ඩන්ඩ් 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 73. | BR/1382/07 | 90/8 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 74. | BR/477/07 | 134/7 | රන්යයි කියනු ලබන මාල 01, පෙන්ඩන්ට් 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 75. | BR/1293/08 | 103/8 | රන්යයි කියනු ලබන මාල 01, පෙන්ඩන්ඩ් 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 76. | BR/325/08 | 37/8 | රන් පාට වළලු 05 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 77. | BR/1623/08 | 106/8 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 78. | BR/1624/08 | 107/08 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 79. | BR/1528/08 | 110/08 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 80. | BR/810/08 | 88/08 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 81. | 37481 | 197/10 | රන්යයි කියනු ලබන මුදු 01, කරාබු ජෝඩු 01, අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 82. | BR/924/07 | - | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 83. | BR/1309/08 | 36/08 | රන්යයි කියනු ලබන මුදු 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 84. | 35919 | 112/10 | රන්යයි කියනු ලබන තෝඩු 02 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 85. | 25722 | 16/08 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 86. | 34634 | 51/09 | රන්යයි කියනු ලබන මුදු 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 87. | 22273 | 170/07 | රන්යයි කියනු ලබන මුදු 03 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 88. | 7795 | 71/06 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 89. | 32659 | 8/9 | රන්යයි කියනු ලබන මාල 02, සාරි කටුවක් අඩංගු මුද්‍රා තැබූ බෝතලය, (වෙන් වෙන් වශයෙන් හඳුනාගත නොහැක) |
| 90. | BR/513/06 | 66/06 | රන් යයි කියනු ලබන අත්පළඳනා (අත්පළඳනාවක් වැනි) 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 91. | AR/503/08 | 46 | රන්යයි කියනු ලබන පෙන්ඩන්ට් 02, මුදු 02 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 92. | BR/392/08 | 138/08 | රන්යයි කියනු ලබන ගුලි 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 93. | BR/1286/07 | - | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 94. | 39403 | 100/10 | රන්යයි කියනු ලබන ගුලි 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 95. | 14742 | 49 | රන්යයි කියනු ලබන කරාබු 04, මාල 01, පෙන්ඩන්ට් 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය (වෙන් වෙන් වශයෙන් හඳුනාගතක නොහැක) |

| අනු. අංකය | නඩු අංකය | PR අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|---|
| 96. | BR/306/04 | 64/04 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 97. | BR/752/95 | 45 | රන්යයි කියනු ලබන කරාබු ජෝඩු 01, කලුපටිය සහිත ඔරලෝසු 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 98. | AR/63/90 | 5 | රන්යයි කියනු ලබන කැබලි 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 99. | AR/60/00 | 155/99 | රන් යයි කියනු ලබන ටසල් 02 ක කොටසක් වැනි භාණ්ඩයක් අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 100. | 52163 | 180 | රන්යයි කියනු ලබන මුදු 01, පෙන්ඩන්ට් 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 101. | AR/60/00 | 156/99 | රන්යයි කියනු ලබන මුදු 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 102. | BR/1278/98 | 61 | රන්යයි කියනු ලබන මාල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 103. | BR/261/94 | 77 | තඹ පැහැති මුදුවක් අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 104. | 59816 | 69/99 | රන්යයි කියනු ලබන කරාබු ජෝඩු 01ක් සහ රන් පැහැති පටිය අඩංගු අත් ඔරලෝසු 01යි |
| 105. | BR/1361/99 | 02/98 | රන්යයි කියනු ලබන කරාබු ජෝඩු 02, කරාබු පිටුපස බෝල 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 106. | BR/763/99/(91) | 124 | රන්යයි කියනු ලබන මුදු 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 107. | 31207 | 128 | රන්යයි කියනු ලබන කරාබු 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 108. | BR/697/93 | 58 | රන්යයි කියනු ලබන ගුලි 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 109. | 83749 | 22 | රන්යයි කියනු ලබන කරාබු ජෝඩු 02, පෙන්ඩන්ට් 01 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 110. | 8403 | - | ඉමිටේෂන් වළලු 03, මාල 01, මුදු 02 අඩංගු මුද්‍රා තැබූ බෝතලය |
| 111. | 12773 | - | වැලි කියුබ් 3/4 |
| 112. | 7605 | | පස් කියුබ් 02 |
| 113. | 7536 | | පස් කියුබ් 03 |
| 114. | 8763 | | පස් කියුබ් 02 |
| 115. | 10785 | | පස් කියුබ් 01 |

07-160

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - අනුරාධපුර**

ප්‍රසිද්ධ භාණ්ඩ වෙන්දේසිය

අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු රාජසන්තක කරනු ලැබූ, නඩු භාණ්ඩ ද කිසිවෙක් හිමිකම් නොපෑම මත අධිකරණයෙන් වෙන්දේසි කිරීමට නියෝග කර ඇති භාණ්ඩ ද නඩු වාර්තා සොයා ගැනීමට අපහසු අධිකරණය භාරයේ ඇති නඩු අංක අපැහැදිලි හා අංක මැකී ගිය පහත සඳහන් සියලු දෑ **2022.07.30 වැනි දින පෙ. ව. 10.00** ට අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර හෝ එදින වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය ඇතිව වෙන්දේසි දින නියමිත වේලාවට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරන ලද අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ එවලේ ම මුදල් ගෙවා ප. ව. 4.00 පෙර අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතු බවත්, සියලුම ගෙවීම් මුදලින් කළයුතු අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් මිලදී ගන්නා ලද භාණ්ඩ සඳහා ගැනුම්කරු විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික

හැඳුනුම්පත හෝ පිළිගත හැකි හැඳුනුම්පතක් ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

07. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් එදින වෙන්දේසියේ රාජකාරි අවසන් වීමට පෙර අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු අතර, ඊට පසුව ලැබෙන පැමිණිලි භාරගනු නොලැබේ.

08. මෙම භාණ්ඩ වෙන්දේසිය පිළිබඳව සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරන බව ද, වැඩිදුරටත් සඳහන් කරමි.

ජේ. ඒ. එන්. එස්. ජයසූරිය,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
අනුරාධපුර.

2022 ජූනි මස 29 වැනි දින,
අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**අනුරාධපුර මහෙස්ත්‍රාත් අධිකරණය - ප්‍රසිද්ධ වෙන්දේසිය**

2022.07.30

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 1. | අංක රහිත | මිට සහිත කැති 01යි |
| 2. | අංක රහිත | මිට සහිත කැති 01යි |
| 3. | අංක රහිත | මිට සහිත කැති 01යි |
| 4. | අංක රහිත | මිට සහිත කැති 01යි |
| 5. | අංක රහිත | මිට සහිත කැති 01යි |
| 6. | අංක රහිත | මිට සහිත කුළු ගෙඩි 01යි |
| 7. | අංක රහිත | මිට සහිත කුළු ගෙඩි 01යි |
| 8. | අංක රහිත | මිට සහිත කුළු ගෙඩි 01යි |
| 9. | අංක රහිත | මිට සහිත කුළු ගෙඩි 01යි |
| 10. | අංක රහිත | මිට සහිත කුළු ගෙඩි 01යි |
| 11. | අංක රහිත | මිට සහිත පොරව 01යි |
| 12. | අංක රහිත | මිට සහිත පොරව 01යි |
| 13. | අංක රහිත | මිට සහිත පොරව 01යි |
| 14. | අංක රහිත | මිට සහිත පොරව 01යි |
| 15. | අංක රහිත | මිට සහිත පොරව 01යි |
| 16. | අංක රහිත | මිට සහිත උදළු 01යි |
| 17. | අංක රහිත | මිට සහිත උදළු 01යි |
| 18. | අංක රහිත | මිට සහිත උදළු 01යි |
| 19. | අංක රහිත | මිට සහිත උදළු 01යි |
| 20. | අංක රහිත | මිට සහිත උදළු 01යි |
| 21. | 52508 | NCTW 2395 ප්ලැටිනා වර්ගයේ යතුරු පැදිය |
| 22. | 11275 | NCHM 7307 බජාජ් බොක්සර් වර්ගයේ යතුරු පැදිය |
| 23. | 37402 | NCBHX 6864 ඩියෝ ස්කූටි යතුරුපැදිය |
| 24. | 65246 | NCBBD 7044 ප්ලේයර් වර්ගයේ යතුරු පැදිය (අබිලි) |
| 25. | 31892 | NCBAZ 3210 පල්සර් වර්ගයේ යතුරු පැදිය |
| 26. | 60275 | NCJH 1806 කැලිබර් වර්ගයේ යතුරු පැදිය |
| 27. | අංක රහිත | වීදුරු බෝතල් 200 යි |

07-122

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - සම්මන්තුර**

ප්‍රසිද්ධ වෙන්දේසි දැන්වීම

සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගවලදී රාජසන්තක කරන ලද පහත සඳහන් භාණ්ඩ **2022.08.11 වැනි දින පෙරවරු 9.00** ට සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණ පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ වෙන්දේසි කිරීමට නියමිතය.

සම්මන්තුර මහෙස්ත්‍රාත් අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ පෙර අවසරය සහිතව එදින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා අතර කාලය තුළ පහත සඳහන් භාණ්ඩ පරීක්ෂා කිරීමට හැකියාව ඇත. මෙම භාණ්ඩවල මිල තක්සේරු කරන ලද වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කළහොත් මෙම භාණ්ඩ වෙන්දේසි කිරීමෙන් ඉවත් කර අධිකරණ භාරයට ගැනීමට හිමිකම් ඇත.

මෙම භාණ්ඩ වෙන්දේසියේ දී ලබා ගන්නා අය ඒ සඳහා මුදල් වහාම මෙම අධිකරණයට ගෙවා රිසිට්පත් ලබා ගැනීමෙන් අනතුරුව එම භාණ්ඩ අධිකරණ පරිශ්‍රයෙන් ඉවත් කර ගැනීමට පියවර ගත යුතු අතර මෙහිදී චෙක්පත් හෝ මුදල් ඇණවුම් කිසිවක් භාරගනු නොලැබේ.

වෙන්දේසි කිරීම පිළිබඳව කිසියම් පැමිණිල්ලක් ඉදිරිපත් කරන්නේ නම් වෙන්දේසි සිදුකරන අවස්ථාවේ දී ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ඉදිරිපත් කරන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

වෙන්දේසියට සහභාගි වීමට කැමති අය සිය ජාතික හැඳුනුම්පත හෝ පිළිගත හැකි ලේඛන සමග පැමිණිය යුතු ය.

මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය,
සම්මන්තුර.

2022 ජූනි මස 21 වැනි දින.

**ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ විස්තරය**

| *අංක* | *නඩු අංකය* | *ලියාපදිංචි අංකය* | *භාණ්ඩ* | *අයිතම ගණන* |
|---|---|---|---|---|
| 1. | 24566/MT/20 | EP - BDJ 5569 | යතුරු පැදිය | 01 |
| 2. | 25487/MT/21 | EP - XA - 5154 | යතුරු පැදිය | 01 |
| 3. | AR/3002/22 | 152 - 4232 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 4. | AR/3003/22 | 158 - 8525 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 5. | AR/3005/22 | EP MR -6420 | යතුරු පැදිය (අමතර කොටස් පමණි) | 01 |
| 6. | 27708/Misc/22 | | සවල් | 03 |
| 7. | 27708/Misc/22 | | යකඩ බාල්දිය | 03 |
| 8. | 27471/Misc/22 | | සවල් | 01 |
| 9. | 27471/Misc/22 | | යකඩ බාල්දිය | 01 |
| 10. | 27481/Misc/22 | | යකඩ බාල්දිය | 01 |
| 11. | 27501/Misc/22 | | සවල් | 01 |
| 12. | 27498/Misc/22 | | සවල් | 01 |
| 13. | 27498/Misc/22 | | යකඩ බාල්දිය | 01 |
| 14. | 27586/Misc/22 | | සවල් | 01 |
| 15. | 27635/Misc/22 | | සවල් | 01 |
| 16. | 27650/Misc/22 | | සවල් | 01 |
| 17. | 27651/Misc/22 | | සවල් | 01 |
| 18. | 27658/Misc/22 | | සවල් | 01 |
| 19. | 27731/Misc/22 | | සවල් | 01 |
| 20. | 27731/Misc/22 | | යකඩ බාල්දිය | 01 |
| 21. | 27799/Misc/22 | | සවල් | 01 |
| 22. | 27798/Misc/22 | | සවල් | 01 |
| 23. | | | River Sand | 27 Cube |
| 24. | | | Dirty Soil | 06 Cube |

07-142

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - මහනුවර**

ප්‍රසිද්ධ වෙන්දේසිය පිළිබඳ නිවේදනය

මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ වන වාහන 14 ක් **2022 ජූලි මස 30 වැනි දින පෙ. ව. 9.30ට** මෙම අධිකරණ පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි සඳහන් වන කිසියම් වාහනයක් සම්බන්ධයෙන් හිමිකම් දැක්වීමට අපේක්ෂා කරන තැනැත්තන් වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 9.30 ට පෙර ස්වකීය හිමිකම තහවුරු කිරීමට අදාළ සාධක රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

02. රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 8.00 සිට පෙ. ව. 9.00 දක්වා වෙන්දේසියේ විකිණීටම නියමිත වාහන පරීක්ෂා කර බැලිය හැක.

03. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි එම වාහන වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතු වේ.

04. වෙන්දේසියෙන් ලබා ගන්නා සියලුම වාහන සඳහා ගෙවීම් එම අවස්ථාවේ දී ම ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ගෙවා එදින ප. ව. 3.00 ට පෙර එම වාහන අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

05. වාහන මිලදී ගැනීමට පැමිණෙන සෑම තැනැත්තෙකු ම ස්වකීය ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

ශ්‍රීනිත් විජේසේකර,
මහෙස්ත්‍රාත්,
මහනුවර.

2022 ජූනි මස 27 වැනි දින,
මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2022.07.30 දිනට මහනුවර මහෙස්ත්‍රාත් අධිකරණයේ වෙන්දේසි කිරීමට නියමිත වාහන**

| අනු. අංකය | නඩු අංකය | වාහන අංකය | වාහන වර්ගය | විස්තරය |
|---|---|---|---|---|
| 01. | AR 1738/20 | අංක රහිත | MR Agusta වර්ගයේ යතුරු පැදිය | ලියාපදිංචි කළ නොහැක. අමතර කොටස් සඳහා පමණි. |
| 02. | AR 2162/20 | WPGL 3643 | HONDA වර්ගයේ යතුරු පැදිය | |
| 03. | 91084/14 | WPHF 4919 | BAJAJ වර්ගයේ යතුරු පැදිය | |
| 04. | 78549/14 | අංක රහිත | YAMAHA වර්ගයේ යතුරු පැදිය | |
| 05. | බී 17813/11 | WPJQ 4956 | NISSAN වර්ගයේ කාර් රථය | |
| 06. | බී 39317/16 | CPEA 0205 | LAND ROVER ඩිෆෙන්ඩර් රථය | |
| 07. | බී 96229/04 | 65 - 1729 | MITSUBISH වර්ගයේ ජීප් රථය | |
| 08. | බී 39068/16 | අංක රහිත | TOYOTA වර්ගයේ ජීප් රථය | |
| 09. | බී 38972/16 | WPQT 0714 | BAJAJ වර්ගයේ ත්‍රීරෝද රථය | |
| 10. | AR 3166/21 | CPTH 5478 | BAJAJ වර්ගයේ යතුරු පැදිය | ලියාපදිංචි කළ හැක. |
| 11. | AR 3168/20 | CPTK 3094 | TVS යතුරු පැදිය | |
| 12. | AR 47611/19 | CPTY 0025 | HERO HONDA වර්ගයේ යතුරු පැදිය | |
| 13. | බී 42834/17 | CPBEX 1953 | HERO DASH වර්ගයේ යතුරු පැදිය | |
| 14. | 23548/19 | CPBHQ 1783 | HONDA DIO වර්ගයේ යතුරු පැදිය | |

07-262

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2023.01.01 සිට 2023.12.31 දක්වා රා තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත් ව **2023.01.01 සිට 2023.12.31** වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයෙහි දැක්වෙන

රා තැබෑරුම් රේන්ද සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් **2022.08.19** වැනි දින **පෙ. ව. 10.30** දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ෆෝර්මයක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදල් තැන්පත් කර ලබාගන්නා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු ය.

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථෝක්ත තැබෑරුම් රා රේන්ද විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු ය.

*(ඈ)* ටෙන්ඩර්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිළිමත් විය යුතු ය.

(1) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය.

(2) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව ජාතික හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතු ය.

(3) සෑම වෙනස් කිරීමක් ම/කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය.

(4) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක් ම ටෙන්ඩර් ෆෝර්ම සමග තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය සහ නම් සඳහන් කර, වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර්පත් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර, වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. මෙම මුදල වලපනේ ප්‍රාදේශීය ලේකම් නමින් නිල්දණ්ඩාහින්න මහජන බැංකුවේ වාර්ෂික ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන්

එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් 'ගෙවීම සඳහා යන්න' සටහන් කරන ලද චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත්කොට, කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිපදෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත්, **2022.09.19** වැනි දින පෙරවරු **10.30**ට මෙම ස්ථානයේ දී නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීමට අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ හැකි ය.

එස්. පී. ළිඳකුඹුර,<br>
ප්‍රාදේශීය ලේකම් (වැ.බ,),<br>
වලපනේ.

2022 ජුනි මස 21 වැනි දින,<br>
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

***උපලේඛනය***

*රා තැබෑරුම් රේන්ද විකිණීම*

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටු වියයුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගන්නා දිනය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|
| අංක 05 පදියපැලැල්ල | පදියපැලැල්ල ග්‍රාමය තුළ | 2022.08.19 | පෙ.ව. 10.30 | 5,000.00 |

07-76

---

# රජයේ නොවන දැන්වීම්

## ඇටර්නි බලය අවලංගු කිරීම

Graekenlands vej, 12, 3 tv, 2300 koebenhavn-s, Danmark යන ලිපිනයේ පදිංචි, දැනට ගංකානිපිල්ලේයාර් කෝවිල පාර, නාවට්කුඩා, මඩකලපුව යන ලිපිනයට අයත් පුලේන්තිරා මෝහනචන්තිරන් (විදේශ ගමන් බලපත්‍ර අංක 211624901) වන මම මඩකලපුව නාවට්කුඩා, පුනොච්චිමුනයි පාර යන ලිපිනයට අයත් චන්දිරාදේවි ඉරාජතුරයි (ජා. හැ. පත් අංකය 598203105 V) යන අයට ප්‍රසිද්ධ නොතාරිස් Birger Petersen Notary Public of Copenhagen Denmark විසින් 2018 ජුනි 18 වැනි දින සහතික කරන ලද මඩකලපුව රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ෆෝලියෝ අංක 75 වොලියුම් 26 සීරියල් 404 හි සටහන් කර ඇති විශේෂ ඇටර්නි බලය 2018 ජූලි 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාවට දන්වා සිටින අතර ඉන් පසු ඇය විසින් මා වෙනුවෙන් සිදු කරනු ලබන ක්‍රියාකාරකම් කිසිවකටත් මම වග නොකියන බව ද මෙයින් දන්වමි.

Pulendra Mohanachandran.

07-130

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ 02, ගැලනි වීදිය, අංක 61 හි පදිංචි ධර්මදස සමරසිංහ (ජා. හැ. ප. අංක 560621477 V) වන මම කොළඹ පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් මාකවිටගේ කිංස්ලි පෙරේරා මහතා විසින් සහතික කරන ලද අංක 3829 සහ 2019 ක් වූ අගෝස්තු මස 23 දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් පන්නිපිටිය, මාලපල්ල, ශ්‍රී සුදර්ශනාරාමය හි වැඩ වසන පූජ්‍ය අග්‍රහැර කස්සප හිමි (ජා. හැ. ප. අංක 561641056 V) හට දෙන ලද ඇටර්නි බලය 2022.01.18 දින සිට අවලංගු කරන ලද බවත්, උන්වහන්සේ විසින් මින් ඉදිරියට කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

ධර්මදාස සමරසිංහ.

07-131

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්මලාන, බොරුපන, රාජසිංහ මාවතේ අංක 14 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 680141428 V දරන අහමඩ් එල් සවුරි ලමීරුඩීන් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ සාමාන්‍ය මහජනතාවට දන්වා සිටින වග නම් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. ආර්. නානායක්කාර විසින් වර්ෂ 2018 මැයි මස 14 වැනි දින ලියා සහතික කළ අංක 1164 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් ඉක්මන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් මා ඇටර්නි බලකාර ලෙස පත් කරන ලද අතර එසේ මා හට ලබාදෙන ලද එකී අංක 1164 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මා විසින් අවලංගු කරන ලදී. ඒ අනුව මෙතැන් සිට එකී ඇටර්නි බලකරු වන මා විසින් කරනු ලබන ඕනෑම ක්‍රියාවක් වලංගු නොවන බවත් එම ඇටර්නි බලය අවලංගු වී ඇති බවත්, මෙයින් දන්වා සිටිමි.

අහමඩ් එල් සවුරි ලමීරුඩීන්.

07-132

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රත්මලාන, බොරුපන, රාජසිංහ මාවතේ අංක 14 දරන ස්ථානයේ පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 680141428 V දරන අහමඩ් එල් සවුරි ලමීරුඩීන් වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ සාමාන්‍ය මහජනතාවට දන්වා සිටින වග නම් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ඒ. ආර්. නානායක්කාර විසින් වර්ෂ 2015 නොවැම්බර් මස 06 වැනි දින ලියා සහතික කළ අංක 759 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් ඉක්මන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් මා ඇටෝර්නි බලකරු ලෙස පත් කරන ලද අතර එසේ මා හට ලබාදෙන ලද එකී අංක 759 දරන විශේෂ ඇටර්නි බලපත්‍රය මා විසින් අවලංගු කරන ලදී. ඒ අනුව මෙතැන් සිට එකී ඇටර්නි බලකරු වන මා විසින් කරනු ලබන ඕනෑම ක්‍රියාවක් වලංගු නොවන බවත් එම ඇටර්නි බලය අවලංගු වී ඇති බවත්, මෙයින් දන්වා සිටිමි.

අහමඩ් එල් සවුරි ලමීරුඩීන්.

07-133

---

## විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

හලාවත, කුරුණෑගල පාර, සේද උයන, අංක 115/27 හි පදිංචි පුලිසිංහ මුදියන්සේලාගේ තරිඳු මාලක (ජා. හැ. අ. 200132203080/ වි. ග. බ. අංක N 7395612) වන මා විසින් ජපානයේ ටෝකියෝ නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ දී 2021.01.08 වැනි දින මිනිස්ටර් හා සාම විනිසුරු ජී. ජී. එස්. සී. රොෂාන් මහතා ඉදිරිපිට අත්සන් කර එකී විදේශීය විශේෂ ඇටර්නි බලපත්‍රයේ සඳහන් ක්‍රියාවන් කිරීම සඳහා මාගේ සැබෑ සහ එකම නිත්‍යානුකූල ඇටර්නි බලකරු වශයෙන් වෙන්නප්පුව, උතුරු කොලින්ජාඩිය, රසිරෝ, අංක 192 හි පදිංචි වර්ණකුලසූරිය සුදෙස් නිම්රෝයි ප්‍රනාන්දු (ජා. හැ. අ. 660011935 V) යන අයව පත් කරන ලද අතර, එය පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල පිහිටි සහකාර රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ, 03 වන කාණ්ඩයේ 56 දරන පත් ඉරුවේ 125 දරන දින පොත් අංකය යටතේ 2021.01.22 වැනි දින ලියා පදිංචි කර ඇති අතර එකී විදේශීය විශේෂ ඇටර්නි බලපත්‍රය මා විසින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මින් සෑම සියලුදෙනාට ම දන්වා සිටිමි. ඒ අනුව ඉහත කී විදේශීය විශේෂ ඇටර්නි බලපත්‍රය මෙතැන් පටන් බල නොපවතින බව ද එකී විදේශීය විශේෂ ඇටර්නි බලපත්‍රය මත එකී ඇටර්නි බලකරු විසින් මින් ඉදිරියට කරනු ලබන සියලුම ක්‍රියාවන්ට කිසිදු වලංගුභාවයක් නොමැති බවත් ප්‍රකාශ කර සිටිමි. තවද, මා විසින් කිසිදු ඇටර්නි බලයක් මෙතැන් පටන් කිසිවෙකුට ප්‍රද ානය කර නැති බවත් මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනයාටත් දැනුම් දෙමි.

පුලිසිංහ මුදියන්සේලාගේ තරිඳු මාලක

07-134

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

මුගුණුවටවන, මෛත්‍රී උයන, අංක 382 හි පදිංචි ගල්ගමුගේ ශිරාණි ධම්මිකා (ජාතික හැඳුනුම්පත් අංක 785371984 V) වන මම 2015.04.27 වැනි දින එන්. එච්. එම්. ශ්‍රියානි දීපිකා නවරත්න නොතාරිස්වරිය ඉදිරියේ මුගුණුවටවන, මෛත්‍රී උයන, අංක 382 හි පදිංචි හේරත් පතිරන්නැහැලාගේ උදයශාන්ත පුෂ්ප කුමාර (ජාතික හැඳුනුම්පත්

අංක 721242242 V) යන අයට පවරන ලද අංක 537 දරන විශේෂ ඇටර්නි හා ඒ හා සම්බන්ධ කටයුතු මෙයින් අවලංගු කොට නිෂ්ප්‍රභා කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් එහි සියළු ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මින් මතුවට හේරත් පතිරන්නැහැලාගේ උදයශාන්ත පුෂ්ප කුමාර යන අය විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවකට හෝ ක්‍රියා සඳහා මාගේ කිසිදු සම්බන්ධයක් නොමැති බව වැඩිදුරටත් මම මෙයින් දිවුරා ප්‍රකාශ කර සිටිමි.

ගල්ගමුගේ ශිරාණි ධම්මිකා.

07-135

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර ඔටෝ ආම් කම්පැනි (පීවීටී) එල්ටීඩී (පෞද්ගලික සමාගම) 2022 මාර්තු මස 29 වැනි දින සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී සංස්ථාගත කළ බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ අංකය : පී. වී. 00255578
සමාගමේ ලිපිනය : අංක 129/1, රත්නම් පාර, කොළඹ 13.

සමාගම් ලේකම්.

07-136

---

## ඇටර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, වෙන්නප්පුව, චාර්ල්ස් විලියම් මාවත, අංක 668/බී දරන ස්ථානයේ පදිංචිව සිට වර්තමානයේ Bergama (BG) Via Della Vittoria n. 3 , Italy සේවයේ නියුතු (ජා. හැ. අ. 812661310 වී සහ වි. ග. බ. අංක එන් 8344293) හිමි ඉම්හාමි මුදියන්සේලාගේ බණ්ඩාර දයා නිසාමන් හෙවත් ඉම්හාමි මුදියන්සේලාගේ දයා නිසාමන් බණ්ඩාර සහ එම ලිපිනයේ ම පදිංචි (ජා. හැ. අ. 798192299 V සහ වි. ග. බ. අංක එන් 8344364) හිමි කෝට්ට හේවගේ ප්‍රනාන්දු මේරියන් සුරේෂා හෙවත් කෝට්ට හේවගේ මේරියන් සුරේෂා ප්‍රනාන්දු යන අය විසින් වෙන්නප්පුව, චාර්ලස් විලියම් මාවත, අංක 668/බී දරන ස්ථානයේ පදිංචි (ජා. හැ. අංක 551861392 V හිමි) කෝට්ට හේවගේ රෙක්ෂි ක්‍රිස්ටෝපර් ප්‍රනාන්දු යන අයට බලය පවරන ලද නිරූපමා ෆොන්සේකා ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සකස් කරන ලද සහ වර්ෂ 2021.03.31 වැනි දින ඉතාලි රටේ මිලාන් නගරයේ ශ්‍රී ලංකා තානාපති තැන ඉදිරිපිට දී සහ සාක්ෂිකරුවන් ඉදිරිපිට දී අත්සන් තබන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර මින්මතු එකී ඇටර්නි බලකරුවන් විසින් කරනු ලබන කිසිම ක්‍රියාවකට අප වග නොකියන බව ද ශ්‍රී ලංකා ජනරජය වෙත මෙයින් දැනුම් දෙමු.

ඉම්හාමි මුදියන්සේලාගේ බණ්ඩාර දයා නිසාමන් හෙවත්
ඉම්හාමි මුදියන්සේලාගේ දයා නිසාමන් බණ්ඩාර.

කෝට්ට හේවගේ ප්‍රනාන්දු මේරියන් සුරේෂා හෙවත්
කෝට්ට හේවගේ මේරියන් සුරේෂා ප්‍රනාන්දු.

07-151

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මාකොළ, මාකොළ දකුණ, සපුගස්කන්ද පාර, අංක 10/බී/4 සහ දැනට No. 4, Media Crescent, Banksiagrove, 6031 Western Australia පදිංචි හේරත් මුදියන්සේලාගේ රසිතා ඩිලානි (ජා. හැ. ප. අංක 836301315 V) සහ විදේශ ගමන් බලපත්‍ර අංක එන් 3608601) වන මම ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. බී. එම්. පෙරේරා මහතා විසින් සහතික කරන ලද අංක 424 සහ 2019 ක් වූ දෙසැම්බර් මස 27 වැනි දින දරන විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් කොළඹ 03, 5 වන පටුමග, අංක 96 හි පදිංචි හේරත් මුදියන්සේලාගේ ඔමාලි සමුද්‍රා (ජා. හැ. ප. අංක 967173010 V සහ විදේශ ගමන් බලපත්‍ර අංක එන් 7783070) හට දෙන ලද ඇටර්නි බලය 2022.03.31 දින සිට අවලංගු කරන ලද බවත්, ඔහු විසින් මින් ඉදිරියට කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බව ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.

හේරත් මුදියන්සේලාගේ රසිතා ඩිලානි

07-152

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීමයි

බෙන්තොට, ඕබඩවත්ත, වටරවුම් පාර, අංක 65 දරන ස්ථානයෙහි පදිංචි අංක 196326201744 (632621744 V) දරන ජාතික හැඳුනුම්පත හිමි වාඩිය පතිරගේ ගාමිණී ජයවීර යන අය විසින් බෙන්තොට, ඕබඩවත්ත, වටරවුම් පාර, අංක 65 දරන ස්ථානයෙහි පදිංචි වාඩිය පතිරගේ උපුල් නන්දන ජයවීර යන අය ඇටර්නි බලකරු ලෙස නම් කිරීමට සකස් කරනු ලැබූ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ශ්‍රීමාලී රෝහණ සිංහ පුංචිහේවා මහත්මිය විසින් වර්ෂ 2013 ක් වූ මාර්තු මස 17 වැනි දින ලියා සහතික කරන ලද අංක 471 දරන ඇටර්නි බලපත්‍රය අද දින සිට අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

වාඩිය පතිරගේ ගාමිණී ජයවීර.

07-161

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නුගේගොඩ, ජම්බුගස්මුල්ල මාවත, අංක 89 ඒ දරන ස්ථානයේ පදිංචිව සිටි සහ දැනට No. 13 Avenue Charles De Gaulle, Escalier B, 78230 Le Pecq, France යන ස්ථානයේ පදිංචිව සිටින දීයගහගේ මහින්ද ශ්‍රීලාල් ද සිල්වා (ජා. හැ. අ. 562481354 V සහ විදේශ ගමන් බලපත්‍ර අංක N 2387177 හිමිකරු) වන මම, මා විසින් බොරලැස්ගමුව, රත්තනපිටිය, පාසල් පටුමග, අංක 19 ''ශ්‍රියානි'' දරන ස්ථානයේ පදිංචි රාජපක්ෂ මුදියන්සේලාගේ වත්තේගෙදර රෝහන තිලක බණ්ඩාර විජේරත්න (ජා. හැ. අ. 543550574 V) යන අයට 2014.12.01 දිනැතිව ප්‍රංශ තානාපති විසින් සහතික කරන ලද සහ ලිඛිත බලධාරිකම් හා ඇටර්නි බලපත්‍ර පොතේ 160 කාණ්ඩයේ 61 පත්‍රිරුවේ අංක 1005 දිනපොතේ ලියාපදිංචි කර තිබූ විශේෂ ඇටර්නි බලපත්‍රයෙන් දී තිබූ බලතල අවලංගු කරන්නට යෙදුනු බවද, එහෙයින් එය බල රහිත බවද, ඉහත කී රාජපක්ෂ මුදියන්සේලාගේ වත්තේගෙදර රෝහන තිලක බණ්ඩාර විජේරත්න යන අය විසින් එකී විශේෂ ඇටර්නි බලපත්‍රය භාවිතයෙන් සිදු කරන කිසිදු ක්‍රියාවකට මා කිසිදු වගකීමකින් නොබැඳෙන බවද, සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙයින් දන්වා සිටිමි.

දීයගහගේ මහින්ද ශ්‍රීලාල් ද සිල්වා.

07-263

### විශේෂ ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කෝට්ටේ, මිරිහාන, රජමහා විහාරය පාර, අංක 228/2 හි ස්ථිර පදිංචි නානායක්කාර වැවගේ දොන් අනුර නානායක්කාර (ජා. හැ. අංක 197501202523) යන අය විසින් කේ. පී. ජී. වී. කේ. ඩයස් ගුණසේකර ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ වර්ෂ 2022 ක් වූ ජනවාරි මස 28 වැනි දිනැති විශේෂ ඇටර්නි බලපත්‍රය මගින් කොළඹ 05, ඇවරිහෙන පාර, අංක 13/30 හි පදිංචි ඇලබඩගෙයි ශ්‍රියානි (ජා. හැ. අංක 197259701800) වෙත බලය පවරන ලද විශේෂ ඇටර්නි බලපත්‍රය වර්ෂ 2022 ක් වූ ජූලි මස 03 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව මින් ඉදිරියට ඇලබඩගෙයි ශ්‍රියානි විසින් එකී ඇටර්නි බලකාරිය ලෙස සිදු කරන ක්‍රියාවන්ට මා හට වගකීමක් නොමැති බව ද මෙයින් දන්වා සිටිනු ලැබේ.

නානායක්කාර වැවගේ දොන් අනුර නානායක්කාර.

2022 ක්වූ ජූලි මස 03 වැනි දින දී ය.

07-271

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

### ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය - අඹගමුව කෝරළය

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2023 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1983 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලට යටත්ව 2023 වර්ෂය තුළ දී පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුළුව) සිල්ලරයට විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා අඹගමුව ප්‍රාදේශීය ලේකම් විසින් 2022.09.19 වැනි දින පහත සඳහන් උපලේඛනයන්හි දැක්වෙන වේලාව දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමය විය යුතු ය.

*(ආ)* ඇප මුදලක් ද වශයෙන් ඕනෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදලක් ද තැන්පත් කර ලබාගන්නා නිල කුවිතාන්සිය; සහ

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදි නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ අතිරේක ආණ්ඩුවේ ඒජන්තගෙන්/ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් පිළිබඳ සහතික කිරීම පිළිබඳ යථෝක්ත විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ;

*(ඈ)* ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවන් කෙරෙහි සැළකිලිමත් විය යුතු ය ඃ

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින් ම සම්පූර්ණ කළ යුතු ය. මෙසේ කිරීමේ දී එහි පහත සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය,

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත්වල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතු ය,

(iii) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය,

(iv) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙකුම ටෙන්ඩර් පෝරම සමග තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි වූ ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ටෙන්ඩර් පත්‍රය, ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා, සීල් තබා, කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංක හා නම සඳහන් කර, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන්වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර් පත්‍රය තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාරගැනීමේ වේලාව ඉකුත්වීමට පෙර අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ සීඝ්‍රගාමී තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවේ ටෙන්ඩර්කරුවන් අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන්, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක්, අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කළ යුතු ය. මෙම මුදල ප්‍රාදේශීය ලේකම් නමින් ගිනිගත්හේන මහජන බැංකුවේ වර්ෂයක ස්ථිර තැන්පත් ගිණුමක රඳවා ගැනීමට එකඟ විය යුතු ය. මෙම තැන්පතු මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් හෝ මහජන බැංකුවෙන් ''ආරක්ෂිත චෙක්පත්'' ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට හා කොන්ත්‍රාත්තුවකට අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

08. කිසියම් ටෙන්ඩරයක් කිහිප දෙනෙකු වශයෙන් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු ය.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් ඒවා **2022.10.19 පෙ. ව. 10.30 ට** මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසන් තීරණය වේ.

11. ටෙන්ඩ විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා අඹගමුව කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ යුතු ය.

සිතාරා රුවිනි ගමගේ,
ප්‍රාදේශීය ලේකම්.

2022 ජුනි මස 27 වැනි දින,
ගිනිගත්හේන අඹගමුව කෝරළයේ,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*විදේශ මත්පැන් තැබෑරුම්*

| *අංකය* | *තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාරගැනීමේ අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| 01. | නෝර්වුඩ් | නෝර්වුඩ් නගර බල ප්‍රදේශය අංක 03 තුළ | 2022.09.19 පෙ. ව. 10.30 | රු. 5,000 |
| 02. | දික්ඔය | හැටන් දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 04 තුළ | 2022.09.19 පෙ. ව. 10.30 | රු. 5,000 |
| 03. | දික්ඔය | හැටන් දික්ඔය නගර සභා සීමාවේ කොට්ඨාස අංක 05 තුළ | 2022.09.19 පෙ. ව. 10.30 | රු. 5,000 |

07-146

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය පහසුකම් යොමු අංක -72552585,77195873, 77196427 සහ 79574476

ස්ථිර අයිරා යොමු අංකය - 6694364

උකස් කරන ලද දේපළ විකිණීම. - 1 වන දේපළ පඩුවාවල කම්කානම්ලාගේ පත්මා ස්වර්ණකාන්ති මියට අයත් වන අතර 2 වන හා 3 වන දේපළ ශ්‍රී බාහ්මන සේනානායක මුදියන්සේලාගේ රම්‍යා කුමාරි සේනානායක මියට අයත් වේ.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018.12.07 දිනැති අංක 2101 දරන ගැසට් පත්‍රයේ හා 2018.11.26 වැනි දින ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන් යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර ලංකා බැංකුව, මහව ශාඛා පරිශ්‍රයේ දී

**1 වන දේපල 2022.08.23 දින පෙ. ව. 11.00 ට ද,**
**2 වන දේපළ 2022.08.23 දින පෙ. ව. 11.30 ට ද,**
**3 වන දේපළ 2022.08.23 දින පෙ. ව. 12.00 ට ද,**

කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් හි වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

**උපලේඛනය**

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ, පහළ විසිදෙක කෝරළේ, මහව ප්‍රාදේශීය සභා සීමාවේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 142 දරන කිරිමැටියාව පළාත ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ F. V. P. 3691 හි සඳහන් තලංගෙදර

ග්‍රාමයෙහි පිහිටි රජයේ ඉඩම වූ, උතුරට : තලංගෙදර මහවැව ද. නැගෙනහිරට : ඉහළගමට ප්‍රධාන පාර ද, දකුණට : දිවුල්ගහ වෙල්වැටද, බස්නාහිරට : තලංගෙදර මහවැව ද මායිම් වූ අක්කර දෙකක් (අ. 2) විශාල බිම් ප්‍රමාණය සහ එහි ඇති සෑම සියලු දේ ද වේ. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L.D.O. Nika/Maha/46/228 හි ලියාපදිංචි කර Nika/Maha/46/229 වෙත ගෙන ගොස් ඇත.

ඉහත කී ඉඩම දැනට පහත ආකාරයට නිරූපණය කර ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ, පහළ විසිදෙක කෝරළේ එකී තලංගෙදර ග්‍රාමයෙහි පිහිටි වැව ඉහළ වත්ත (F. V. P. 3691 හි ලොට් 54 හා 55 ඒකාබද්ධ කළ) නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක මහතා විසින් මැන සාදන ලද 1993.01.10 දිනැති අංක 912/93 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ඉඩමට එකී අංක 912/93 දරන පිඹුරට අනුව, උතුරට : ලොට් 53 වැව ද, නැගෙනහිරට : තලංගෙදර සිට පහළගම දක්වා පාර දිගට වෙන් කළ රක්ෂිතයද, දකුණට : ලොට් 57Ka 1 කුඹුරද, බස්නාහිරට : ලොට් 53, වැව ද මායිම් වූ අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසිපහක් (අ. 1, රූ. 3, පර්. 25) හෙවත් හෙක්ටයාර බිංදුවයි දශම හතයි හයයි දෙකයි පහක් (හෙක්ටයාර 0.7625) විශාල බිම් ප්‍රමාණය සහ එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද වේ. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L.D.O. Nika/Maha/46/228 හි ලියාපදිංචි කර Nika/Maha/46/229 වෙත ගෙන ගොස් ඇත.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මීඔයෙන් එගොඩ කෝරළේ, ගිරිබාව ප්‍රාදේශීය සභා සීමාවේ, ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 2C, වීරපොකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, රාජාංගන වම් ඉවුර යාය 1 ග්‍රාමයේ පිහිටි රාජාංගන යාය නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක මහතා විසින් මැන සාදන ලද 2000.02.20 දිනැති අංක 5342/2000 දරන පිඹුරෙහි ලොට් 127 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 127ට උතුරින් : ඇළ ද, නැගෙනහිරට : ලොට් 128 ද, දකුණට : ලොට් 147 හා 148 ද බස්නාහිරට : 124 ද මායිම් වූ අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසි දෙකක් (අ. 1, රූ. 3, පර්. 22) විශාල බිම් ප්‍රමාණය සහ එහි ඇති ගහකොළ, වගාවන් ඇතුළු වෙනත් සෑම සියලු දේ ද වේ.

ඉහත කී ලොට් 127 පහත උපලේඛනයෙන් විස්තර කර ඇති ඉඩමේ නැවත මැනීමක් වන අතර එය පහත පරිදි විස්තර වේ.

එකී රාජාංගන වම් ඉවුර යාය 1 ග්‍රාමයේ පිහිටි රාජාංගන යාය නමැති ඉඩමට සර්වේයර් ජනරාල් විසින් සාදන ලද Ku/9 දරන පිඹුරෙහි ලොට් 127 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 127 ට, උතුරට : ලොට් 126, ඇළ සහ පාර රක්ෂිතය ද, නැගෙනහිරට : ලොට් 128 ද, දකුණට : ලොට් 141 පාර, රක්ෂිතය ද, බස්නාහිරට : 124 ද මායිම් වූ අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසිදෙකක් (අ. 1, රූ. 3, පර්. 22) විශාල බිම් ප්‍රමාණය සහ එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සෑම සියලු දේ ද වේ. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Nika/Giri/64/194 හි ලියාපදිංචි කර ඇත.

3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වන්නි හත්පත්තුවේ, පහළ විසිදෙකේ කෝරළේ, මහව ප්‍රාදේශීය සභා සීමාවේ, මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 136, යද්දිගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, යද්දිගම ග්‍රාමයේ පිහිටි යද්දිගමවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. ජී. බන්දුතිලක මහතා විසින් මැන සාදන ලද 1997.12.20 දිනැති අංක 3769/97 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ලොට් 2ට, උතුරට : මහව සිට මඩගල්ල දක්වා පාර ද, නැගෙනහිරට : පී. කේ. පද්මසිරිට අයත් ඉඩම ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස සහ පියදාසගේ ඉඩම ද, බස්නාහිරට : පියදාසගේ ඉඩම සහ පී. කේ. ගාමිනී ජයරත්නට අයිති මෙම ඉඩමේ බෙදූ කොටස ද මායිම් වූ අක්කර දෙකක් (අ. 2) විශාල බිම් ප්‍රමාණය සහ එහි ඇති ගහකොළ, වගාවන් ඇතුළු වෙනත් සෑම සියලු දේ ද වේ.

එකී ලොට් 1 දරන ඉඩම පහත උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමක් වන අතර එය පහත පරිදි විස්තර වේ.

ඉහත කී යද්දිගම පිහිටි සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල වූ එනම් එකී ඉඩමට, උතුරට : මහව සිට මඩගල්ල දක්වා පාර ද, නැගෙනහිරට : පද්මසිරිට අයිති ඉඩම ද, දකුණට : පියදාසගේ ඉඩම ද, බස්නාහිරට : ගාමිණීගේ ඉඩම ද යන මායිම් තුළ පිහිටි අක්කර දෙකක් (අ.2) විශාල බිම් ප්‍රමාණය සහ එහි ඇති ගහකොළ, වගාවන් ඇතුළු වෙනත් සෑම සියලු දේ ද වේ. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Nika/Maho/73/05 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. එම්. කේ. එස්. ගුණතිලක,
කළමනාකරු.

ලංකා බැංකුව,
මහව.

07-139

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

සෙන්කඩ එක්ස්පෝට්.
ගිණුම් අංක : 0072 1000 2396.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.10.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් පනස් තුන් ලක්ෂ හැත්තෑ එක් දහස් එකසිය අනූ පහයි ශත පනහක (රු. 5,371,195.50) මුදලද, 2019 ඔක්තෝබර් මස 16 වැනි දින සිට අංක 3998 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් පනස් ලක්ෂයක (රු. 5,000,000.00) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.12.27 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.12.11 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි

**2022.08.17 වැනි දින පෙ. ව. 11.30 ට** පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වතුගෙදර - දකුණ අංක 87A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වතුගෙදර පිහිටි "කම්මලවත්ත හි ලොට් 12හි ලොට් 12A නොහොත් මහගෙදර වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. ඒ. ආර්. චන්ද්‍රසිරි යන අය විසින් සාදන ලද 2018 සැප්තැම්බර් 06 දාතම හා අංක 3774 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 12A වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 13 (බලපිටිය දිස්ත්‍රික් උසාවියේ නඩු අංක 36158හි සඳහන් වාස් ද එස්. ගිනිගේ හි 816 දරන පිඹුරේ නිරූපිත), නැගෙනහිරට : විවේකාරාමය පාර, දකුණට : තෙනුවර වෙසෙන්ති පදිංචිව උන් ගොඩඋඩවත්ත සහ බස්නාහිරට : ගොඩඋඩවත්ත සහ මෙම ඉඩමේ ලොට් 12C යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම නමයක් (P. 24.9) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3774 දරන පිඹුරට අනුව ය.

එකී ලොට් 12A පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, බලපිටිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, වතුගෙදර - දකුණ අංක 87A දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වතුගෙදර පිහිටි ''ලොට් 12 වශයෙන් සීමා නිර්ණය කොට ඇති උපබෙදුම කම්මලවත්ත නොහොත් මහගෙදර වත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඊ. ගාල්ලගේ යන අය විසින් සාදන ලද 1974 ජූලි 05 දාතම හා අංක 784 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 12A වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ලොට් 13, නැගෙනහිරට : පාර, දකුණට : තෙනුවර වීජෙන්ති පදිංචිව උන් ගොඩඋඩවත්ත සහ බස්නාහිරට : ගොඩඋඩවත්ත සහ මෙම ඉඩමේ ලොට් 12C යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විසි හතරයි දශම නමයක් (P. 24.9) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 3774 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව D 156/57 යටතේ බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්,

07-260

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ටී. සිවසිදම්බරම්, ජේ. දුලේන්ද්‍ර සහ කේ. මනෝන්මන්නි,
ගිණුම් අංක : 1109 5765 8907.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020.10.29 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක් කෝටි අසූ පන් ලක්ෂ තිස් තුන් දහස් හාරසිය දහසයයි ශත විසි තුනක (රු. 18,533,416.23) මුදලද, 2020 සැප්තැම්බර් මස 16 වැනි දින සිට අංක 1517 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි හැට එක් ලක්ෂ හැට හතර දහස් දෙසිය හැත්තෑ හයයි ශත හැට හතක (රු. 16.164,276.67) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම දෙකයි පහක් (16.25%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021.01.01වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2020.12.17 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි

**2022.08.12** වැනි දින ප. ව. 3.30 ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, ගන්දහයෙ කෝරලේ. මාවතගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, මාවතගම (උතුර) අංක 678, ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ මාවතගම ග්‍රාමයේ පිහිටි "සීෆීල්ඩ් එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. එම්. තිලකරත්න බණ්ඩා විසින් සාදන ලද 2017 ජුනි මස 09 දතම හා අංක 2017/132 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙද වෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : තිස්ස මුදලාලි විසින් හිමිකම් කියන ඉඩම සහ ඇල, නැගෙනහිරට : ඇල සහ තුරෙයිරාජා සිවසිදම්බරම් විසින් හිමිකම් කියන ඉඩම, දකුණට : තුරෙයිරාජා සිවසිදම්බ්රම් විසින් හිමිකම් කියන ඉඩම සහ කඳගොල්ල සිට කුරුණෑගල - මහනුවර ප්‍රධාන පාර දක්වා පාර (ප්‍රා ස), බස්නාහිරට : කඳගොල්ල සිට කුරුණෑගල - මහනුවර ප්‍රධාන පාර දක්වා පාර (ප්‍රා ස) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් ( P : 30) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 2017/132 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමක් වේ :-

එකී මාවතගම ග්‍රාමයේ පිහිටි "සීෆීල්ඩ් එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. කේ. කනගසබෙයි විසින් සාදන ලද 1994 අප්‍රේල් මස 06 දතම හා අංක 386 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන් කොට ලොට් 01 වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : තිස්ස මුදලාලි විසින් හිමිකම් කියන ඉඩම සහ ඇල, නැගෙනහිරට : ඒ කාසිඅම්මා විසින් හිමිකම් කියන ගල්වලකුඹුර වෙන්කෙරෙන ඇල, දකුණට : තුරෙයිරාජා සිවසිදම්බරම් විසින් හිමිකම් කියන ඉඩම, බස්නාහිරට සහ නිරිතට : කඳගොල්ල සිට මාවතගම දක්වා පාර (ගම් සභා) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිහක් (30P.) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග අංක 386 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව H 1270/59 යටතේ කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-261

---

### ප්‍රාදේශීය සංවර්ධන බැංකුව

#### 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ආදයම් නිලධාරී කොට්ඨාසයේ, සිංහල පත්තුවේ, 68 බී මැදිරිගිරිය ග්‍රාම සේවා නිලධාරී කොට්ඨාසයේ, කවුඩුලුවැව 01 වන පියවර නමැති ගමේ පිහිටා ඇති සර්වේ ජෙනරාල්වරයා විසින් සාදනු ලැබ ඔහු භාරයේ ඇති අංක අ. ජ. පි. පො. 107 දරන පිඹුරෙහි අංක 274 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්. 02, රූඩ් 02, පර්. 03 විශාලත්වය ඇතැයි ගණන් බලා තිබෙන කහඹිලියාව යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට මායිම් උතුරට 204, නැගෙනහිරට 286, දකුණට 285, බස්නාහිරට 275 යන මෙකී මායිම් තුළ පිහිටි ඉඩමෙන් මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම්තුමියගෙ වර්ෂ 2007.07.16 වැනි දින සහ අංක එන්සීපී/එච්පී/එල්1/මිනුම් පොදු දරන ලිපියෙන් ලැබූ අවසරය මත බෙද වෙන් කර රඹුක්කන පදිංචි බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් මහතා විසින් වර්ෂ 2007.07.20 වැනි දින මැන සකස් කරන ලද අංක 4721 දරන පිඹුර ප්‍රකාරව එහි කැබලි අංක 01 දරන කොටසින් නිරූපණය කර ඇති උතුරට

අ. ජ. පී. පො. 107 පිඹුරේ 204 දියසෙන්පුර කහඹිලියාව පාර ද, නැගෙනහිරට : අ. ජ. පී. පො. 107 පිඹුරේ 286 මැදිරිගිරිය කහඹිලියාව පාර ද, දකුණට : අ. ජ. පී. පො. 107 පිඹුරේ 285 ද, බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසක් ද යන මායිම් තුළ පිහිටි ඉඩම් ප්‍රමාණය අක්. 01, රූඩ් 0, පර්. 25.19 එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේත් සමග

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් **2022 අගෝස්තු මස 02 වැනි අගහරුවාදා දින පෙ. ව. 11.00** ට ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ගල්අමුණ ශාඛා පරිශ්‍රයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය COVID ක්‍රියා පිළිවෙලට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලවම පවත්වනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2018.03.02 දින රජයේ *ගැසට් පත්‍ර* සහ 2018.05.03 දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම.* - මැදිරිගිරිය ඔරලෝසු කණුව අසල හතරමංහන්දියෙන් දකුණට හැරී දියසෙන්පුර නගරය දක්වා ගමන් කරන්න. දියසෙන්පුර නගරයේ හතරමංහන්දියෙන් දකුණට හැරී පොළොන්නරුව - කිරිමැටියාන මාර්ගයේ කිලෝ මීටර් 03ක් පමණ ගමන් කර කහඹිලියාව හංදියට පිවිසෙන්න. අදාළ දේපළ පාරේ දකුණුපස පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර) සහ එම කොමිස් මුදලට අදාළ සියළුම බදු.
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500,
5. විකුණුම් වියදම් සහ වෙනත් අදාළ ගෙවීම්,
6. විකුණුම් සහතිකයට අදාළ මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරි, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, උතුරු මැද පළාත් කාර්යාලය, අංක 65/ඩී, 04 වන පටුමග අභය පෙදෙස, අනුරාධපුරය වෙත ගෙවිය යුතු වේ. දුරකථන අංක 025 222 3080, 025 222 5214.

ඉහත සඳහන් ඉතුරු මුදල් දින 30ක් ඇතුළත ගෙවීමට අපොහොසත් වුවහොත් දැනට ගෙවා ඇති මුදල (25%) බැංකුව සන්තක කර ගැනීමටත් දේපල නැවත වෙන්දේසි කිරීමටත් බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකි ය.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 130 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය :*
6 ඒ, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩන්ස්,
කොළඹ 08
දුරකථන අංක : 011-2671467, 011- 2671468
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2671469
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

07-129

---

**ලංකා බැංකුව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන සහ 2000 අංක 54 දරන පනතින් නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංක -74990517
(2) ස්ථිර අයිරා යොමු අංකය - 72011405

ආනමඩුව, උස් වැව පාර, කෞශල්‍යා රයිස් මිල් හි ගුණසේකර මුදියන්සේලාගේ විජේසිංහ මහතාට අයත් දේපළ විකිණීම

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2019.11.08 දිනැති අංක 2149 දරන *ගැසට් පත්‍රයේ* හා 2019.10.28 වන දින ඩේලිනිවුස්, තිනකරන් හා දිනමිණ යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු

ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර ලංකා බැංකුව, ආණමඩුව ශාඛා පරිශ්‍රයේ දී **2022.08.16 වැනි දින පෙ. ව. 11.00 ට** කොළොන්නාව, විහාර මාවත, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් සමාගමේ වෙන්දේසිකාර තුසිත් කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ කුමාරවන්නි පළාතේ, දෙමළ හත්පත්තුවේ, පණ්ඩිත පත්තුවේ ආනමඩුව ප්‍රාදේශීය සභා සීමාවේ ආනමඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තම්මැන්නාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ තෙන්නෙන්කුරියාව ග්‍රාමයේ පිහිටි තෙන්නෙන්කුරියාව කැලේ, පලුගහහේන සහ තෙන්නෙන්කුරියාවහේන'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු J. A. V. රාජනායගම් විසින් සාදන ලද 2006.02.17 දිනැති අංක 6867 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, උතුරට : ජිනදාසගේ ඉඩම ද, නැගෙනහිරට : හලාවත සිට ගල්ගමුව දක්වා පාර ද, දකුණට : ඉතිරි කොටස ද, බස්නාහිරට : කතෝලික දේවස්ථානයේ ඉඩම ද මායිම්ව රූඩ් දෙකයි පර්චස් විස්සක (රූ. 2, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්තවන අතර එහි ඇති සියලු දේත් වේ.

එකී ඉඩම පහත ඉඩමෙහි නැවත මැනීමකි එනම් :

එකී තෙන්නෙන්කුරියාවහේන නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පොන් තංගවඩිවේලු විසින් සාදන ලද 2001.10.28 දිනැති අංක 1951 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා විස්තර කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1, උතුරට : ජිනදාසගේ ඉඩම ද, නැගෙනහිරට : ආනමඩුව සිට ගල්ගමුව දක්වා පාර (RDA)ද, දකුණට : ඉතිරි කොටස ද, බස්නාහිරට : කතෝලික දේවස්ථානයේ ඉඩම ද මායිම්ව රූඩ් දෙකයි පර්චස් විස්සක (රූ. 2,පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ සමග වේ. මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ S 55/190හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. පී. විජේතුංග,
කළමනාකරු.

ලංකා බැංකුව,
ආනමඩුව ශාඛාව.

07-140

---

### සෙලාන් බැංකුව පීඑල්සී - කොට්ටාව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ මීගොඩ පදිංචි පොල්වත්ත කංකානමලාගේ රවීන්ද්‍ර පෙරේරා යන අය බන්ධනදායී/උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

*1 වන වෙන්දේසිය .-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ අංක 447/සී ගෙහුන්වල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගෙහුන්වල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඩී. එදිරිවික්‍රම විසින් සාදන ලද 2013.10.14 දිනැති අංක 2057 බී සැලැස්මේ සඳහන් ගොඩපරගහලන්ද නමැති ඉඩමේ ලොට් X ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2057 බී සැලැස්ම අනුව පර්චස් තිස් දෙකයි දශම හතයි අටක් (පර්. 32.78) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපල **2022 අගෝස්තු මස 05 වැනි දින පෙරවරු 10.30 ට** සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලුපාර, කොළඹ 03 දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.* - කොළඹ - අවිස්සාවේල්ල මාර්ගය ඔස්සේ මීගොඩ මංසන්ධිය දක්වා පැමිණ දකුණු පසට ඇති ආටිගල පාරට හැරී තවත් කි. මී. 1 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

*2 වන වෙන්දේසිය. -*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ අංක 447/සී ගෙහුන්වල ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ ගෙහුන්වල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඩී. එදිරිවික්‍රම විසින් සාදන ලද 2005.02.22 දිනැති අංක 2057 සැලැස්මේ නිරූපණය වන ගොඩපරගහලන්ද නමැති ඉඩමේ ලොට් ඒ 3 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 2057 සැලැස්මට අනුව පර්චස් විස්සයි දශම නවයයි එකක් (පර්. 20.91) නොහොත් හෙක්ටයාර් 0.0529 ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපල **2022 අගෝස්තු මස 05 වැනි දින පෙරවරු 10.45 ට** සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලුපාර, කොළඹ 03 දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - කොළඹ - අවිස්සාවේල්ල මාර්ගය ඔස්සේ මීගොඩ මංසන්ධිය දක්වා පැමිණ දකුණුපසට ඇති ආටිගල

පාරට හැරී තවත් කි. මී. 1.5 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කොවිඩ් - 19 උපදෙස් වලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2022.05.27 වැනි දින පළ වී ඇති අතර, අද, ඩේලිමිරර් සහ තිනකුරල් යන පුවත්පත්වල 2022.05.30 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.
1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000.00, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500.00 , 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වේතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී, (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 2456473, 2456478.

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක 011- 3068185, 011- 2572940.

07-156

## සෙලාන් බැංකුව පීඑල්සී - බත්තරමුල්ල ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ තලංගම දකුණ පදිංචි කුමාරගේ දොන් තිලක් තනුජ යන අය බන්ධනදායි/උකස්කරු වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුව වෙත සුරක්ෂිත කර ඇත.

(1) බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමාව තුළ, කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ 492 ඩී රජමල්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ බත්තරමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද 2018.05.02 දිනැති අංක 8346 සැලැස්මේ නිරූපණය වන මීගහවත්ත හෙවත් දෙල්ගහවත්ත නමැති ගස්, වගා, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියල දේ සමග ඉඩමේ ලොට් 1 ඒ ලකුණු කළ බෙද වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 8346 සැලැස්ම අනුව පර්චස් හයක් (පර්. 06) නොහොත් හෙක්ටයාර් 0.01517 ක් විශාල ඉඩම.

(2) පෙර කී බත්තරමුල්ල පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් සාදන ලද 2018.05.02 දිනැති අංක 8346 සැලැස්මේ නිරූපණය වන මීගහවත්ත හෙවත් දෙල්ගහවත්ත නමැති ගස්, ගොඩනැගිලි, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 1 බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 8346 සැලැස්ම අනුව පර්චස් අටයි දශම පහයි බිංදුවක් (පර්. 8.50) ක් නොහොත් හෙක්ටයාර් 0.02150ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපල **2022 අගෝස්තු** මස **05** වැනි දින පෙරවරු **10.00** ට සෙලාන් බැංකුව පී එල් සී අංක 90 ගාලු පාර, කොළඹ 03 දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.* - බත්තරමුල්ල මංසන්ධියේ සිට කොළඹ පාර ඔස්සේ මීටර් 50 ක පමණ දුරක් ගිය විට වම්පසට ඇති අඩි 15ක් පමණ පළල ඇති මාර්ගයට හැරී තවත් මීටර් 30 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ මාර්ගයේ වම්පසින් පිහිටා ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පනවන ලද කොවිඩ් - 19 උපදෙස් සහ නීති රීතිවලට අනුකූලව මෙම වෙන්දේසිය පවත්වනු ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.* - රජයේ ගැසට් පත්‍රයේ 2022.05.27 වැනි දින පළ වී ඇති අතර, අද, ඩේලිමිරර් සහ තිනක්කුරල් පුවත්පත්වල 2022.05.27 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි

බද්ද, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), අදාල බදු මුදල්, 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 3,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 1,500 , 6. සියලුම ප්‍රචාරක වියදම්, 7. ගැණුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුලත ගෙවිය යුතුයි.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැනුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී, (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 2456473, 2456468..

ඉහත සඳහන් වෙන්දේසිය පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

තුසිත් කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකතන අංක 011- 3068185, 011- 2572940.

07-157